(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 33.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

## 2018 සැප්තැම්බර් 06 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.00 ට

## පැමිණි මන්ත්‍රීන් :

**ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

**ගරු ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

**ගරු රංජිත් අලුවිහාරේ මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,** පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

---

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

**ගරු මයන්ත දිසානායක මහතා**

**ගරු විමලවීර දිසානායක මහතා**

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**

**ගරු වාසුදේව නානායක්කාර මහතා**

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**

**ගරු බිමල් රත්නායක මහතා**

**ගරු නිමල් ලාන්සා මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2015 වර්ෂය සඳහා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ ගිණුම් පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2014 වර්ෂය සඳහා ටවර් හෝල් රඟහල පදනමේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය පිළිගන්වා, එම වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු මයන්ත දිසානායක මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු බිමල් රත්නායක මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වැනි වගන්තිය යටතේ නියෝග;

(ii) 2013 සහ 2015 වර්ෂ සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තා;

(iii) 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා;

(iv) 2015 සහ 2017 වර්ෂ සඳහා සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තා සහ ගිණුම්;

(v) 2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වාර්ෂික වාර්තා;

(vi) 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(vii) 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

මාතලේ, රත්තොට පාර, අංක 87/බී දරන ස්ථානයෙහි පදිංචි එම්. ඒ. එල්. ෆයිසාල් මහතාගෙන් ලැබුණු 2018.08.01 දිනැති පෙත්සම ගරු රංජිත් අලුවිහාරේ මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. ගණපූරණය නොමැති වීම :** එකල්හි ගණපූරණයක් නොමැති බවට මූලාසනයේ සැලකිල්ල යොමුවූයෙන් පාර්ලිමේන්තුව ගණන් කරන ලදී.

එවිටද ගණපූරණයක් නොසිටි බැවින් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 11 යටතේ පූ. භා. 10.11 ට නියෝජ්‍ය කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා, 2018 සැප්තැම්බර් 07 වැනි සිකුරාදා පූ. භා. 10.00 වනතෙක් පාර්ලිමේන්තුව කල්තබන ලදී.